මුතුමුදලිගේ නිශ්ශංකගෙන්
තවත් සිනමාමය නිර්මාණයක්

Disclaimer

This is a work of fiction. Names, characters, places and incidents either are products of the author's imagination or are used fictitiously. Any resemblance to actual events or locales or persons, living or dead, is entirely coincidental.

"මෙය ප්‍රබන්ධ කෘතියකි. මෙහි එන නම් ගම් චරිත හා සිදුවීම් සියල්ල හුදෙක් කර්තෘගේ පරිකල්පනීය නිමැවුම් හෝ සපුරාම ප්‍රබන්ධාර්තයෙන් යොදාගත් ඒවා වේ. ජීවත් වන හෝ මියගිය පුද්ගලයන්ට, දේශපාලන පක්ෂවලට, ආගමකට, ඇදහීමකට, ආයතනවලට, සිදුවීම්වලට, ඒවායේ කිසියම්ම හෝ සමානත්වයක් ඇත්නම් එය මුළුමනින්ම අහම්බයකි."

කතෘ

මේ කෘතියට පිදුමක් නැත.

අවශ්‍යනම්

ආසික්ලන්ත වැසියන්ම

මෙය පිදුමක්

ලෙස භාරගනිත්වා

ප්‍රථම මුද්‍රණය : 2023 සැප්තැම්බර්

ISBN 978-624-5552-10-8

ආසික්ලන්තය

2023 @ මුතුමුදලිගේ නිශ්ශංක

මුද්‍රණය -

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත

කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව - අශෝක කුලතුංග

කවර නිර්මාණය - කලණ ගංගානාත් / හසන්ත විජේනායක

පරිඝනක පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2023

මා ඔබට කතාවක් පවසමි. ඔබ මෙය විශ්වාස නොකරනු ඇත. එය විශ්වාස කරන්නැ'යි මම බල කරන්නේ ද නැත. එහෙත් මෙය කියවන විට "ඔබේ මනස හැකිතාක් විවෘත ව තබාගන්නැ'යි" පමණක් ඉල්ලා සිටිමින්, මම කතාව ආරම්භ කරමි.

පෙර කියවීම

Beta Reading

චින්තක වීරේන්ද්‍ර

මංජුල විජේසිංහ

රොහාන් මිරිහාගල්ල

චතුරංග අමරතුංග

"මෙච්චර දියුණු රටක් දාලා උඹ ඔය කොහේද යන්න යන්නේ?"

"ඇමෙරිකාවට තාත්තේ"

තාත්තා හැල්ලු හිනාවක් පෑවේ ය.

"ඇමෙරිකාව" ඔහු එම වචනයත් මිමුනුවේ ඔච්චමෙනි.

"බලපන් උඹේ ඔය ඔළුව ඇතුළෙන් අං දෙකක් එනව ද කියලා"

මම ඔළුව අත ගෑවෙමි. එහි අං දෙකක් නොවීය.

තාත්තා තවත් කෝපයට පත් විය.

"ඇයි බොල ගොනෝ, ඇමෙරිකාව වගේ ද අපේ ලක, බලපන් මේ ලක කොච්චර දියුණු ද? මොනවද මේ ලකේ අඩු? උඹට ලැජ්ජා නැද්ද ඒ හිඟන රටට ලගින්න යන්න?"

ඔහු එම වචන පිටකරන සෑම මොහොතක ම මගේ හදවත කීතු කීතු වී ගියේ ය. මට ලලනාව මතක් විය. ඇයගේ රට හිඟන රටක් යැයි පැවසීම තාත්තා ඇයට කළ මදි පුංචි කමක් යැයි මට සිතුණේ ය. එය සිරිලක තරම් දියුණු රටක් නොවන බව නම් සැබෑ ය. එහෙත් ඈ මගේ ලලනා ය. හිඟන රටක සිටියත් ඈ මගේ ලලනාමය.

"දැන් මොන කෙන් ගෙඩියකට ද උඹ ඔය හිඟන 'කාවට' යන්නේ?"

තාත්තා 'කාවට' යැයි කීවේ ඇමෙරිකාවට ය. එවන් නොදියුණු රටවල් ගැන ලකේ දියුණු ජනපද වැසියෝ කතා කරන්නේ "අඩ" වචනයෙනි.

"ම...ම්ම්ම" මම එය පැවසීමට අදිමදි කෙරුවෙමි.

"පුතණ්ඩියා ඔය ගැනියෙක් ගේන්න.. කාවේ ඉන්න එකියක්ලු" අම්මා කුස්සියේ සිට බෙරිහන් දෙනු මට ඇසුණේ ය.

"හත්තිලව්වයි" තාත්තා ඔළුවට අත ගසා ගත්තේ ය.

"තොට මේ රටේ කළු සමනලියෝ හොඳ නැද්ද පර සුද්දියෝ ගේන්න?" තාත්තා කෑ ගැසුවේ ය.

ඒ අපවාදයට නම් මගේ බඩ බොක්ක ඇබරී ගියෙන් මට බඩ රුදාවත් ඇති විය.

"සුද්දියෝ ඊයා... කාවේ සුද්දියෝ ඊටත් ඊයා... අඩු ම තරමින් ඕකුන් පස්සවත් හරියට හෝදනව ද?... උඹ ඔය සුදු ඇතිකරේ එක්ක නිදාගන්න යනව නම් එහෙට ම වෙලා හිටපිය. ගොනෝ අපේ ලක් පරපුරේ එකෙක්වත් කරපු නවනින්ගිරාවක් ද තෝ ඔය කරන්න හදන්නේ" තාත්තා මගේ මුහුණට එබී කෑ ගැසුවේ ය.

"ඒ වුණාට මම යනවා... මට ලලනවමයි ඕන" මම මුරණ්ඩු වුණෙමි.

එහෙත් ඒ මගේ කටින් පිටවුණේ පිට නොවිය යුතු වචනයකි.

"ලලනා..." තාත්තගේ දෑස් විශාල විය.

"එතකොට ඒකී ලකෙන් එහාට තොලොංචි වෙච්චි එකියක් ද?"

"නැහැ...." මගේ මුහුණ ලැජ්ජාවෙන් රතුවී ගියේ ය.

"එහෙනම්"

මා යළිත් පොළොවේ ඉරි ඇන්දෙමි. එවිට ම අම්මා කුස්සියේ සිට යළිත් කෑ ගැසුවා ය.

"ඒකි සුද්දියක්, මූ ඒකිට ලලනා කියලා නම තියලා, හියෑක්" අම්මා එය පවසමින් ඔච්චම් පානු මට ඇසුණේ ය. ඒ ඔච්චමට නම් තරහෙන් ගුගුරමින් සිටි තාත්තාගේ මුහුණත් යාන්තම් සිනහවකින් පිරී ගියේ ය.

"තෝ අම්මගේ පුතෙක්නේ බොල" ඔහු කීවෙන් අම්මා කුස්සියේ සිට තකහනියේ ම එළියට දුව ආවා ය.

"කාගේ මොකෙක්ද?" ඈ අතේ තිබුණු හැදි මිට තාත්තට දික් කළා ය.

"අප්පගේ පුතෙක් කියලා කිව්වේ?"

"හ්ම්... ඒක ඉතින් කියන්නත් දෙයක් ද.. තමුසෙත් ඉස්සර වත්තේ ගැනුන්ට ලපයි සිපයි නම් දැම්මේ, ඕකාත් ඒ ටික ම තමා කරලා තියෙන්නේ"

"හ්ම් හ්ම් හ්ම්... ඒවා ඕනේ නැහැ, ඒවා ඕන නැහැ" තාත්තා ඇඳ සිටි සරොම කැහැපොට ගසාගෙන නිවසේ මුදුන් වහල උඩ මිදුලට පාත් වෙන්නට එල්ලා තිබුණු සිංහ කොඩිය දෙස බැලුවේ

ය.

"සිංහායොත් බලුවෙනවා මුන් කරන වැඩවලට" කී ඔහු පපුවත් ඉදිරියට පුම්බාගෙන මිදුල දෙසට අඩිය තැබුවේ ය.

"මොකී වුණත් කමක් නැහැ. උඹ ඔය කාවේ ගැහැනුන්ව මෙහෙට ගේන්නෑ. යනව නම් තෝත් එහෙට ම තොලොංචි වෙලා පල"

යමින් ගමන් මිදුලට පහත්වී තිබුණු කොඩිය දෙසට සැලියුටයක් ගසා කොඩියේ තිබුණු පරයි බෙට්ටක් ඇඟිල්ලෙන් ගෙන ඉවතට විසිකළේ ය.

"රොබට්ටියට කියපන් මේ කොඩිය හෝදලා ආයේ එල්ලන්න කියලා, මොන දේ නැතත් කොඩිය හරියට තියෙන්න ඕන"

ඔහු ඉමහත් වූ ශ්‍රද්ධාවෙන් යුක්ත ව කොඩිය දෙස යළිත් බැලුවේ ය. ගේ ඉස්සරහට ම කාරා කෙළ පිඩක් ගසා පාර දෙසට හැරී නොපෙනී ගියේ ය.

රොබට්ටී

තාත්තා "රොබට්ටී" යැයි කීවේ අපේ ගෙදර වැඩ කාරකමට සිටින රොබෝ කාන්තාවට ය. ලක දැන් දියුණු දේශයකි. සෑම නිවසක ම රොබෝ කාන්තාවක් සේවය කරයි. රජයේ නීතිය අනුව පස්දෙනකුට අඩු පවුලකට එක් රොබට්ටියක් ද, ඊට වඩා වැඩි පවුල්වලට රොබට්ටියන් දෙදෙනකු ද තබා ගැනීමේ අවසර ඇත. රොබට්ටීලා සිරිලකේ ම නිපැයුමක් බැවින් ඔවුන්ට දමා ඇත්තේ ද ලකේ නම් ය.

මීට අවුරුදු දහයකට පෙරාතුව මුල් ම රොබට්ටී මාර්කට්ටුවට ආවේ "ලලිතා" නමිනි. ඉන්පසුව ලලිතා ප්‍රෝ One ද ඉන්පසු ව තලතා, පද්මිනී, කුසුමා, ලතා යන රොබට්ටිලත් මෑත කාලයේ දී ශානී, ලානී, වජිරා, පුෂ්පා යන රොබට්ටිලත් නිෂ්පාදනය විය.

මේ අතරින් අප නිවසේ තවම සිටින්නේ "කුසුමා ප්‍රෝ" වර්ගයේ රොබට්ටියකි. අම්මා ඇයගේ යකඩ දේහය උඩින් චිත්තයක් සහ

හැට්ටයක් අන්දවා ඇත්තේ ඇයගේ හෙලුව වසන්නට වුවත් බොහෝ නිවෙස්වල රොබට්ටිලාගේ හෙලුව වසන්නේ නැත. එසේ වසන්නට හෙලුවක් ද එකියන්ට නැත.

තාත්තා කුසුමාව නිවසට ගෙන ආ දිනයේ දී ම අම්මා ඇයට චීත්තයක් ඇන්ද වූ සැටි මට තවමත් මතකය. එම මතකය මගේ සිතින් නික්මී නොයන්නේ අම්මා කුසුමාට ඇඳුම් ඇන්දවීම ගැන තාත්තා තවමත් විරසක ව සිටින නිසා ය.

"මොනාද ගොං නැම්ඹියේ ඔය කරන්නේ, මුන්ට කොහේද හෙලුවක්, ඔය මනුස්ස ශරීරයක් වගේ හදලා තිබුණට මුන් යකඩ" තාත්තා කෝපයට පත්වී කෑ ගැසූ මුත් අම්මා කුසුමාගේ හෙලුව වසන්නට ගත් වෑයම අත් නොහැරියා ය.

"හෙලුව තිබ්බා නැතෑ, මේ ගැහැනියෙක්, තමුසේ පිරිමියෙක්" අම්මා කීවා ය.

"ඉතින් මම පිරිමියෙක් කියලා මේ යකඩ ගොඩට මොකක් කරන්න ද?" තාත්තා අම්මගෙන් ඇසුවේ ය. එහෙත් සමඟ ම එතෙක් නිහඬව සිටි රොබට්ටී මුල් ම වතාවට මැෂින් හඬින් තෙපරබාන්න පටන් ගත්තා ය.

"පෑක් පෑක් පෑක්...මම කුසුමා...ප්‍රෝ වන් වන් සෙවන්.. මහත්තයට ඕන දෙයක් මට කරන්න...පෑක් පෑක් පෑක්" ඇය අත් දෙකත් දික් කරගෙන තාත්තා ඉදිරියට එන්නට පටන් ගත්තා ය. අම්මා අන්දමින් සිටි චීත්තයෙන් ම ඇද ඇයව නතර කළා ය.

"මහත්තයට ඕන දෙයක් කරන්න නෙමෙයි, උඹව අපි ගත්තේ මට ඕන දෙයක් කරන්න. මම කියන විදියට මිසක් වෙන අය කියන විදියට වැඩ කරන්න බැහැ"

"පෑක් පෑක් පෑක්" රොබට්ටිය අත් දෙකත් වනමින් යකඩ ඇස් දෙක අම්මා දෙසට හැරවූවා ය.

"කුසුමා ප්‍රෝ වන් වන් සෙවන්... පෑක් පෑක් පෑක්....නෝනා කියන ඕන දෙයක් කරන්න ලෑස්තියි...පෑක් පෑක් පෑක්"

එතැන් සිට කුසුමා ප්‍රෝ වන් වන් සෙවන් අපේ නිවසේ තවත් සාමාජිකාවක් බවට පත් වූවා ය.

හුණ්ඩු කාර්

ඇත්තෝට තමන්ගේ ම හුණ්ඩු කාර් ඇත. නැත්තෝට තමන්ගේ ම හුණ්ඩුකාර් නැතත් පොදු හුණ්ඩු කාර් එකේ ගමන් බිමන් යා හැක.

මීට වසර කිහිපයකට පෙර ලකේ ජනතාව ගමන් බිමන් ගියේ ටාටා බස්වල ය. ලකට ආසන්නයේ ම ඇති ඉන්දියානු රටේ නිපැයුමක් වූ ඒවා තඩි මහත යකඩ ගොඩවල් ය. එහෙත් ලකේ ම තෙලජ්ජපජ්ජාවල පාසැල් ශිෂ්‍යයකු විසින් නව නිෂ්පාදනයක් ලෙස සොයා ගත් "හුණ්ඩු කාර්"වලට රටේ පාලකයින්ගේ අත හිත සහ අනුග්‍රහය යහමින් ලැබීමෙන් පසුව එම ශිල්ප ක්‍රමය තවත් වැඩි දියුණු කොට රටේ පොදු ප්‍රවහන සේවයටත් උචිත පරිද්දෙන් "හුණ්ඩු කාර්" නිෂ්පාදනය කරනු ලැබුවේ ය.

හුණ්ඩු කාර් - යන්නේ උඩිනි. ඒවා හුණ්ඩුවක හැඩය ගත් බැවින් හුණ්ඩු කාර් ලෙස හඳුන්වා ඇත. පොළවේ මට්ටමින් අඩි කිහිපයක් උඩින් ධාවනය වන හුණ්ඩු කාර් හෙලිකොප්ටරයක ඇති සුළං පොල්ලක් හැඩැති සුළං පොලු තුනකින් ක්‍රියාකරවන්නකි. හුණ්ඩුකාර්වලට ම ගමන් කිරීමට මාර්ගයක් ද ඇති අතර එම මාර්ගය විනිවිද නොපෙනෙන ලේසර් කිරණෙන් සලකුණු කොට ඇති එකක් නිසා නිවෙස්වල සිට උඩ බැලූ විට එම කිරණ පෙනෙන්නේ නැත. පෙනෙන්නේ හිස් ආකාසය පමණි. එහෙත් හුණ්ඩු කාරයේ රියැදුරාට හුණ්ඩු කාරය හරහා අහස් මාර්ග හොඳින් දැක ගත හැකි වෙයි.

හුණ්ඩු කාර් පොදු ප්‍රවාහන සේවයට එකතුවීමත් සමඟ ම පෙර පුරුද්දට ම සමහරු ඒවා හුණ්ඩු බස් ලෙස හඳුන්වන්නට වූ අතර, රජය ඊට සහමුලින් ම විරුද්ධ විය.

"මීට පස්සේ ලකේ බස් නැහැ. තියෙන්නේ කාර්. හැම ලක් වැසියම ගමන් බිමන් යන්න ඕන කාර්වලින්, ඒ නිසා මොනම හේතුවකටත් හුණ්ඩු කාර්, බස් ලෙස හඳුන්වන්නට අපි ඉඩ දෙන්නෑ"

එම කතාවට හැමෝම එකඟ වූවෝ ය.

පොදු ප්‍රවාහන සේවයට එකතු වූ හුණ්ඩු කාරය බසයක් මෙන් විශාල නොවීය. එහෙත් සාමාන්‍ය හුණ්ඩු කාරයට වඩා පොදු හුණ්ඩුකාරයේ ආසන ප්‍රමාණය වැඩි වූ අතර මගීන්ට සුව පහසුව හිඳගෙන යා හැකි පරිදි තෙලජ්ජපජ්ජාවල සිසුවා විසින් ඒවා ඉතාමත් හොඳ මට්ටමින් වැඩි දියුණු කොට තිබුණේ ය.

(හුණ්ඩු කාර් නිපැයූ තෙලජ්ජපජ්ජාවල සිසුවා ගැනත් ඔබ දැනගත යුතු ය. ඔහු අද ට්‍රිලියනපතියකි. තෙලජ්ජපජ්ජාවල සමන් කුමාර නමින් වෙන ම පරිජ්ඡේදයකින් අපි ඒ ගැන කතා කරන බැවින්, ඔහු ගැන මේ පිටුවෙන් වැඩි යමක් කතා කරන්නට බලාපොරොත්තු නොවෙමු. එහෙත් පාඨක ඔබ දැන ගත යුතු විශේෂ කරුණක් පමණක් මෙහි සටහන් කළ යුතු ය. ට්‍රිලියනපතියකු වුවත් තෙප්පජ්ජිවල සමන් කුමාර අඳින්නේ සුදු සරමත්, සුදු අත් දිග කමිසයත් පමණි. පලඳින්නේ ලකේ නිෂ්පාදිත සෙරප්පු දෙකකි. ඒ ගැන ඔහුගෙන් විමසූ විට ඔහු මාධ්‍යයට පැවසුවේ මේ ආකාරයට එක ම වර්ගයේ ඇඳුමක් දිනපතා ඇඳීම ඔහුගේ කාලය ඉතිරි කර දීමක් බව යි.

"එක ම ඇඳුමක් අඳින එක ලේසියි. එතකොට අද අඳින්නේ මොකක්ද හෙට අඳින්නේ මොකක්ද කියලා තීරණය කරන්න ඕන නැහැ." ඔහු පවසා ඇත.)

******

මම කොටහේන බස්නැවතුමට ගියෙමි. හුණ්ඩු කාර් යන්නේ පොළොව මට්ටමින් අඩි ගණනාවක් උඩින් නිසා හුණ්ඩු කාර් නැවැත්වීම සඳහා විශේෂ නැවතුමක් ඉදිකොට ඇත. තට්ටු කිහිපයක පාලමක් මෙන් ඉදිකොට ඇති මේ හුණ්ඩු කාර් නැවතුමේ ඉහළ මාලයට යා යුත්තේ විදුලිසෝපානයකිනි. මම විදුලිසෝපානයෙන් ඉහළ ම මාලයට ගොස් නැවතුමෙහි එක දිගට දමා ඇති ආසන පේළියක හිඳ ගත්තෙමි.

"දැන් පැමිණෙන 176 හුණ්ඩු කාරය කොළඹ - බොරැල්ල දක්වා පමණක් ගමන් කරන බැව් කරුණාවෙන් සලකන්න. මෙන්න ඒ

නිවේදනය නැවතත් දැන් පැමිණෙන හුණ්ඩු කාර ය කොළඹ බොරැල්ල දක්වා පමණක් ගමන් කරන බැව් කරුණාවෙන් සලකන්න"

ආසනයේ හිඳගත් විගස ම යකඩ කටින් කෑ ගසා පවසනු ඇසුනෙන් මා ආසනයට තවත් බරවී හිඳගත්තෙමි. නුගේගොඩ යන හුණ්ඩු කාරය තවත් මොහොතකින් පැමිණෙනු ඇත.

******

හුණ්ඩු කාර් නැවතුම සම්පූර්ණයෙන් ම වායු සමීකරණය කොට ඇත්තෙන් එය මද සීත බවකින් යුක්ත ය. මම අතේ වූ බෑගය පපුවට තුරුලු කොටගෙන හිඳගත්තෙමි. බෑගයේ කොනක් මගේ යටි බඩෙහි ගෑවෙන විට, එහින් දැනුණු සනීපයට මට මගේ ලලනාව මතක් විය.

ඇය සුන්දරය, ලා නිල් පැහැති මනස්කාන්ත නෙත් සඟළකුත්, තඹ පැහැ කොන්ඩයකුත් ඇයට ඇත. මා ඇය සමඟ මීට දිනකට පෙර කතා කළෙමි. එවිට ඇය හිඳගෙන සිටියේ ඇමෙරිකාවේ මුහුදු වෙරළකට ආසන්නයේ බැවින් එහි වූ සූරයාලෝකයෙන් ඇයගේ කොන්ඩය රත්තරං පාටින් දිස්නය දුන් බැව් මතක් වන විට මගේ හදවත ආලයෙන් මත්වී යයි. ඒ මතක් වීමත් සමඟ ම මම ඇයට එසැණින් ම "එසැණ වීඩියෝ" හරහා ඇමතුමක් ගත්තෙමි. ඇය එයට පිළිතුරු දුන්නා ය.

"කොහොමද අම්මියෝ?" මම සිංහලෙන් ඇසුවෙමි.

(මා කතා කරන දෑ ලක් තාක්ෂණය අනුව ඉබේ ම ඉංග්‍රීසි භාෂාවට හැරවී ඇයට ඇසෙයි. - ඇය ඉංග්‍රීසියෙන් පවසන දේත් මට ඇසෙන්නේ සිංහලට පරිවර්තනය වීමෙනි.)

"මට හොඳයි තාත්තියෝ, ඔයාට?"

"මටත් හොඳයි.. අද මම පාස්පෝට් කන්තෝරුවට යනවා පාස්පෝට් එක ගන්න"

"අද ම ගන්න පුළුවන් ද?"

"ඔව්...මම විනාඩියේ සේවාව ඇක්ටිව් කරලා තියෙන්නේ.

පාස්පෝට් කන්තෝරුවට ගිහින් විනාඩියකින් ගන්න පුළුවන්"

"හ්ම්... " ඇය සුසුමක් හෙළුවා ය.

"ඇයි?" මම ඇසුවෙමි.

"නැහැ... ඇමෙරිකාවේ නම් දවස් දෙක තුනක් යනවා ඒකයි"

"හ්ම්" මම ද හුස්මක් ඉහළට ඔසවා ගත්තෙමි. "මොනවා කරන්න ද අම්මියෝ, ඔයා නොදියුණු රටක ඉපදුනේ ඔයාගේ වරදකට නෙමෙයිනේ"

"ඒ වුණාට මට බයයි විජේ"

ඇය විජේ යයි පවසන්නේ සැබැවින්ම ඇයගේ හඳවතට ආලය මුහුකුරා ආ විට ය. මම දුරකතනය මගේ ඇස් ආසන්නයට ම ගත්තෙමි. ඇයගේ ලා නිල්පාට ඇස් ඇතුළේ ඇති කළු බෝලය විශාල වෙමින් ඇත.

"ඇයි ලලනා"

"අපි දෙන්නට එකතු වෙන්න පුළුවන් වෙයි ද විජේ?"

"ඇයි බැරි ලලනා"

"ඒ වුණාට මට බයයි. මම දුප්පත් කෙල්ලෙක්, ඔයා..."

"දුප්පත්, පෝසත් කියන්නේ අපේ මිනිස්සු ඒ ගොලන්ගෙම වාසියට හදාගත්තු දේවල් ලලනා. ඔයා ඔය මනස්ගාත හිතන්න එපා. අපේ ආදරය නිර්මල නම් අපේ බලාපොරොත්තුත් ඒ විදියට ම ඉෂ්ට වෙයි"

ඇය සුසුමක් හෙළුවා ය. එහෙත් සමඟ ම ඇයගේ බඩ බුරුල් වී "ග්‍රර්‍රර්‍ර්‍ර්" හඬක් ආයෙන් මම දුරකතනය ඇස්වලින් මඳක් ඈත් කළෙමි.

"ඒ මොකක්ද?"

"සමාවෙන්න...." ඇය ලැජ්ජාවෙන් ඇඟිරී අතක් පිටුපසට යවා බටනයක් එබුවා ය. එහෙත් සමඟ ම වතුර ගලාගෙන යන හඬක් ඇසුණේ ය.

"මම වැසිකිළියේ ඉන්නේ, වාතය ටිකක් පිට වුණා"

මම සිනාසුනෙමි. ඇය ද සිනාසුණා ය. අපි දෙදෙනා ම මොහොතකට සිනාසෙන්නට වුණෙමු.

"පිස්සු කෙල්ල" මම කීවෙමි.

"පිස්සු කොල්ලා" ඇය කීවා ය.

"මේ..... " මම තොල් ලෙව කැවෙමි.

"ඇයි"

"පොඩ්ඩක් පෙන්නන්නකෝ"

"මොනවද?" ඇය යළිත් ලැජ්ජාවෙන් ඇඹරුණා ය.

"අරක"

"මොකක්ද?"

"අරක අනේ"

"බැහැ"

"ඇයි"

"නිරුවත කියන්නේ ආදරයේ සංකේතය නෙමේනේ විජේ"

"ඒ කියන්නේ මගේ ආදරය පාරිශුද්ධ නැද්ද ලලනා?" මම කෙඳිරුවෙමි.

"එහෙත්"

"හදවත කකාරනවා ඔයා ඔහොම කියනකොට"

"අනේ ඇයි විජේ?"

"හ්ම් කමක් නැහැ, ඔයාට මම බල කරන්නෑ කෙල්ලේ"

"අනේ මං ගැන වරදවා හිතන්න එපා විජේ. එහෙත් ...." ඇයගේ දෑසින් කඳුළක් නැගී එන්නට විය. "ඔයා මෙහෙට ආව ම මම ඒක පෙන්නන්නම්, එතකන් මගේ හිත රිද්දන්න එපා විජේ" කී ඇය දුරකතනය ඇයගේ තොල් ආසන්නයට ගත්තා ය.

"කෝ දැන් මට කිස් එකක් දෙන්න"

"කොතැනටද?"

"මෙතැනට" ඇය උඩු තොලේ ලපයට ඇඟිල්ල තැබුවා ය.

"හුම්මා" මම ස්ක්‍රීනය සිප ගත්තෙමි.

"ලකේ හදන අලුත් ෆෝන් එකට හාදු චුම්බකයකුත් එනවා... ඒක ආව ම ඔයාට මගේ කිස් එකත් දැනෙයි"

"හ්ම්..එහෙනම් හොඳයි.. එහෙත් ඊට කලින් ඔයා මෙහෙට එනවනේ"

"ඔව් අම්මියෝ... අද පාස්පෝට් එක ගත්තු හැටියම මම එනවා"

"ආ... තාත්තී එහෙනම් පාස්පෝට් එක අරගෙන මට ඒකේ පිංතූරයකුත් එවන්න"

"ඒ මොකටද?" මම ඇසුවෙමි.

"මටත් බලන්න ඕන... කවදා හරි මටත් ඔයාගේ රටේ පාස්පෝට් එකක් ගන්න පුළුවන් වෙයිනේ"

ඇය එසේ අසද්දි මගේ හදවත යළිත් ශෝකයට බර වී ගියේ ය. අනේ ඇමෙරිකවේ ගැහැනු කොයි තරම් අවාසනාවන්ත ද, සිතුවිලිවලින් මගේ නහර පිරී යන්නට විය.

"ඔයා ඔහොම කියද්දි මට දුකයි අම්මී?" මම කීවෙමි.

"දුක් වෙන්න ඕන නැහැ තාත්ති, ලකේ පාස්පෝට් එකක් ගන්න එක තමයි අපේ රටේ හැම කෙල්ලගෙ ම හීනය"

"හ්ම්" මම මිමුනුවෙමි.

"හ්ම්" ඇයත් සුසුමක් හෙළුවා ය.

"හැමදේම හරි යයි... ඔයා බය වෙන්න එපා... තව ටික දවසයිනේ"

"ඊළඟට පැමිණෙන හුණ්ඩු කාරය කොළඹ - නුගේගොඩ දක්වා ධාවනය වනු ඇත. මෙන්න ඒ නිවේදනය නැවතත්, ඊළඟට පැමිණෙන හුණ්ඩු කාරය කොළඹ - නුගේගොඩ දක්වා ධාවනය වනු ඇත" යකඩ කටින් මොර දෙන්නට වූයෙන් මම ආසනයෙන් හිට ගත්තෙමි.

"මම එහෙනම් යනවා" මා ඇයට කීවෙමි.

"පරිස්සමින් තාත්තී"

"මට තාත්ති කියන්න එපා, විජේ කියන්න" මා ඇයට කීවෙමි.

"මටත් අම්මි කියන්න එපා... සාරා කියන්න"

"නැහැ ඔයා සාරා නෙමෙයි මගේ ලලනා"

"ලලනා...?"

"ඔව්... ලලනා...ඒක ලකේ නමක්"

"හා" ඇය සිනසුණා ය. මා ද සිනාසුණෙමි.

දුරකතනය තොලට ළංකොට යළිත් ඇයට හාද්දක් දුන් මම ආසනයෙන් හිට ගත්තෙමි.

******

මම හුණ්ඩු කාරයේ පිටුපස ම ඇති අසුනකට ගියෙමි. එහි ආසන බොහෝමයක් ම හිස් ව ඇති බැවින් ජනේලය අසලට ම වී පහතින් පෙනෙන කොටහේන මංසන්දිය දෙස බලා හිඳගත්තෙමි. එහෙත් සමඟ ම හුණ්ඩු කාරයේ සේවය කරන රොබට්ටියක් මා ඉදිරියට විත් හිටගත්තා ය. ඇයගේ අතෙහි බංදේසියක තැබූ බිම වීදුරු කිහිපයක් ඇත.

"පැක් පැක් පැක්...කොටහේනේ හිදන් නුගේගොඩට විනාඩි පහළොවයි තප්පර විස්සක් තියෙනවා මහත්තයා. ඔබේ ගමන් විඩාව නිවෙන්නත් එක්ක...බොමුද සීතල වතුර වීදුරුවක්"

"හා" මම කීවෙමි.

ඇය බංදේසියෙන් වතුර වීදුරුවක් ගෙන මා අතේ තැබුවා ය. මම ඇයට ස්තුති කළෙමි. ඊළඟට ඇය ගොස් අනිත් ඉදිරි ආසනයේ මගියා ඉදිරියෙහි හිටගත්තෙන් වතුර වීදුරුවත් තොලේ තබා ගත් මම යළිත් කොටහේන මංසන්දිය දෙස බලා කල්පනා කරන්නට විමි.

උඩ සිට බැලූ විට වීදියේ ඇවිදින මිනිසුන්ව පේන්නේ පොඩියට ය. මට "අහස උසට නැඟ ගියාට" ගීතය මතක් විය.

"අපි කොතරම් උඩට ගියත් ආයෙමත් ආ යුත්තේ පොළොවට ම නොවේ ද?"

මම ඒ දෙස මඳ වෙලාවක් බලා සිටියෙමි.

ලලනා ලකට ආ පසුව ඇයවත් මේ වීදි දිගේ රැගෙන යා යුතු ය. කොටහේන මංසන්ධියේ ඇති සුපෝඛභෝගී අවන්හල් සහ කඩ සාප්පු දිගේ ඇයව එක්ක යා යුතු ය. මේ අරුම පුදුම දේශයේ දියුණුව ඇයට පෙන්විය යුතු ය.

ඇය හුණ්ඩු කාර් දැක නැත. මේ තරම් විශාල ගොඩනැගිලි ද ප්‍රීතියෙන්, සාමයෙන් ජීවත් වෙන මිනිසුන් ද දැක නැත. මේ ලක් දේශය දුටු විට ඈ පුදුම වනු ඇත. සතුටු වනු ඇත. මා සමඟ තව තවත් ආලයෙන් බැඳෙනු ඇත.

මගේ තොල් එකට පූට්ටු විය. නළල රැලි ගැසී ගියේ ය. ලක් දේශය ගැන පුහු ආඩම්බරයෙන් හදවත ඔද වැඩී යනු මට දැනුණේ ය.

ඇයට මම ලකේ පාස්පෝටයක් අරන් දිය යුතු ය. ඇයවත් මේ දියුණු දේශයේ ම කෙනකු බවට පත් කළ යුතු ය.

අභිමානවත් ලක් පුරවැසියකු ලෙස මට ලලනාට කළ හැකි මහඟු ම උපකාරය එය ම වන්නේ ය.

එයත් සමඟ හුණ්ඩු කාරය ආකාසයට නැග්ගේ ය. ආකාසයේ ගමන් කරමින් තිබුණු අනෙක් හුණ්ඩු කාර් සමඟ ම කරට කර ගමන් කරන්නට පටන් ගත්තේ ය. මම ද සුවපහසු ආසනයට හොඳින් හේත්තු වී සීතල වතුර වීදුරුව පානය කරන්නට වීමි. හුණ්ඩු කාර දමා තිබුණු එෆ්. එම් යන්ත්‍රයේ හඬ මගේ කනට ඇසෙන්නට විය.

"මෙන්න නාවික හමුදාපතිතුමාගේ විශේෂ ඉල්ලීමක්. ලකට බෝට්ටුවෙන් පැමිණෙන ඔස්ට්‍රේලියානුවන්ට ඔබේ නිවසේ නවාතැන් දෙන්න එපා. බෝට්ටුවලින් පැමිනෙන සංක්‍රමණිකයින්ට ලකේ ඉඩ නැහැ"

එය ඇසෙත් ම වතුර වීදුරුව මගේ අතට තද වී ගියේ ය. එම නිවේදනයට මා කෝප වන්නට ඇත. මිනිස්සු කොයි තරම් ආත්මාර්ථකාමී ද? ඕස්ට්‍රේලියාවට පමණක් නොව ඇමෙරිකාවටත් මේ ලකේ ඕනෑ තරම් ඉඩ ඇත. එහෙත් ලක් රජය ඔවුන්ට ලකට පැමිණීමට ඇති සෑම මාර්ගයක් ම වසා දමා දැඩි සම්බාධක ද

පනවා ඇත්තේ කුමක් නිසා ද? ඔවුන් ද අපි වගේ මනුස්සයන් නොවේ ද? ඔවුන්ටත් අප මෙන්ම මේ දියුණු දේශයේ සුර සැප විඳීමට නොහැක්කේ ඇයි?

"හිතක් පපුවක් නැති එවුන්, කාවේ යුවතියන් මෙහෙට එන්න පෙරුම් පුරනවා, උන් කළු කොල්ලන්ට කැමතියි. එහෙත් එන්න බැහැ. බෝට්ටුවෙන් මෙහෙට එන්න ගිහින් උන් කී දෙනෙක් නම් මැරුණ ද?" මම තොල් මැතුරුවෙමි. ජාත්‍යාලයෙන් ඔද වැඩී තිබුණු මගේ හදවත කෝපයෙන් රත් වන්නට විය.

ඇතීන් හුණ්ඩු කාරයේ ආසනයක හිඳගෙන සිටින රොබට්ටී මා දෙස බලා සිටිනු පෙනෙයි. රොබට්ටිලාට මිනිසුන්ගේ තොල් සෙලවීම කියවීමට හැකි ය. සමහර රොබට්ටිලා රජයේ ඔත්තුකරුවන් සේ ද ක්‍රියා කරයි. ඒ නිසා ම රජයට දෙස් තැබීම පසෙකලා හුණ්ඩු කාරයේ යමින් තිබුණු ගීතයට ඇහුම්කන් දුන් මා එය මිමිනීමට පටන් ගත්තෙමි.

"රුවල් නැවෙන් ගොඩ බැහැලා

ගාලු කොටුව මැද හිඳගෙන

හඳපානේ ගැහුවත් බයිලා.."

ටටන් ටටන් ටන්....

රොබට්ටී මා දෙස බලා මඳ සිනහවක් පෑවා ය. මා ද ඇයත් සමඟ සිනහසුණෙමි.

******

හුණ්ඩු කාරයට ගොඩවූ විට නිවේදනය කළ පරිද්දෙන් ම විනාඩි පහළොවයි තප්පර විස්සකින් මම නුගේගොඩට පැමිණියෙමි. නුගේගොඩ හුණ්ඩු කාර් නැවතුමෙන් බසිද්දී ම මගේ ජංගම දුරකතනය හරහා පාස්පෝට් කන්තෝරුවේ වෙබ් අඩවියට ලොග් වුණු මම එහි විනාඩියේ සේවාව ඇක්ටිව් කළෙමි.

මම පාස්පෝට් කන්තෝරුවේ පිළිගැනීමේ කවුන්ටරයට යත් ම එතැන සිටි සුරූපී ලක් තරුණියක් දෑත් එකතු කොට සිනහා මුසු

මුහුණෙන් මාව පිළිගත්තා ය.

"ආයුබෝවන් මහත්මයා"

"ආයුණබෝවන්... මම විජේ පංචාල"

මගේ නම ඇසුනු මොහොතෙම ඇය එතැන තිබුණු ලියුම් කවරයක් ගෙන එය මගේ අතේ තැබුවා ය. මා එය විවර කළෙමි. එහි මගේ ගුවන් බලපත්‍රය විය.

"බොහෝම ස්තුතියි. හරි ම ඉක්මනට වැඩේ වුණා" රතු පාටට දිලිසෙන අලුත් ම ගුවන් බලපත්‍රයේ සුවඳට මගේ ජාත්‍යාලය යළිත් පිබිදී ගියේ ය.

"මේ සුන්දර අපේ රටයි, අපි හැමෝම රටට ණයයි" සුපුරුදු ලෙසට ම පිළිගැනීමේ සේවිකාව ලක් රජයේ ආදර්ශ පාඨය කීවෙන් මමත් එය ම ප්‍රතිරාව දෙන්නට වීමි.

"මේ සුන්දර අපේ රටයි අපි හැමෝම රටට ණය යි"

"විනාඩියේ සේවාව ඇක්ටිව් කළාට ඔබටත් ස්තුතියි මහත්මයා. මෙන්න මෙතැනින් අත්සන තබන්න" කී ඇය සතරැස් ටැබ් යන්ත්‍රය මා දෙසට දික් කළා ය.

මම කුරෙන් එහි අත්සන තැබුවෙමි.

"ඔය ගමන් බලපත්‍රය ජීවිත කාලෙට ම වලංගුයි මහත්මයා. ඔබට එයින් කිසිම අවසරයකින් තොරව ලෝකයේ රටවල් එකසීය පනස්හතකට යන්න පුළුවන්... ඕ සමාවෙන්න" ඇය නළල කසා ගත්තා ය.

"රටවල් එකසිය පනස් හයක්, රුසියාවට අද උදේ ලක් රජය සම්බාධක පැනෙව්වා"

"හා කමක් නැහැ... යුධ කලාප වලට යන්න කොහොමත් මගේ හිතේ අදහසක් නැහැ... ලක් රජය දිනේවා"

"ලක් රජය දිනේවා"

මා එතැනින් ආයේ නිදහස් කුරුල්ලෙක් මෙනී. ලෝකයේ රටවල් එකසිය පනස්හයකට ම කිසිම අවසරයකින් තොරව යා හැකි අරුම පුදුම විදේශ ගමන් බලපත්‍රය මා ලබා ගෙන ඇත.

දැන් මට ඇත්තේ ලකේ ඕනෑ ම ගුවන් තොටුපළකට ගොස් මේ ලකින් පිටත්වීම පමණි.

යමින් ගමන් විදේශ ගමන් බලපත්‍රයත් පපුවට තුරුලු කරගත් මම එහි ඡායාරූපයක් ලලනාට යැව්වෙමි.

"මම එනවා අම්මියා"

'ආදරය කියන්නේ ඔබටයි මටයි'

******

එදින නිවසට ගිය පසුව මගේ සිතට හිස්පාසුවක් නොවීය. අම්මා රොබට්ටී අතේ කෑම පිඟාන කාමරයට ම එවා තිබුණත් එය කෑමට තරම් නිදහසක් ද මගේ මනසට නැත. මම ඇඳෙහි දිගාවී මගේ ලලනා සමඟ පෙම් කෙළින්නට වීමි.

"අද මගේ හිතට හරි ම සතුටුයි කෙල්ලේ" මම ඇයට කීවෙමි.

"අවංක ආදරය හැමවෙලේ ම ජය ගන්නවා විජේ"

"ලලනා"

"හ්ම්"

"ඇයි ඔයා මට ඔය තරම් ආදරේ?"

"ඇයි විජේ ඔයා එහෙම අහන්නේ?"

"නැහැ, මම වගේ කළු කොල්ලෙක්ට"

ඇය වීඩියෝව මුහුණට ළං කොට මඳ සිනහවක් පෑවා ය.

"ආදරය කියන්නේ පාට ද විජේ?"

"නැහැ"

"එහෙනම්?"

"ආදරය කියන්නේ ආදරයට"

"ඉතින් ඒක ම තමයි මමත් ඔයාට ආදරේ"

"හ්ම්" ඇය නිරන්තරයෙන් ම කරන්නාක් මෙන් මම ද මගේ කට උළුක් කර ගත්තෙමි.

"මමත් වෙලාවකට හරි ම බොළඳයි නේ?" මම ඇසුවෙමි.

"ආදරේ කියන්නෙත් බොළඳ දෙයක් තමයි" ඇය කීවා ය.

"මේ ඒක නෙමෙයි, ඔයා කවද්ද මෙහෙට එන්නේ"

මම කල්පනා කළෙමි. ගුවන් බලපත්‍රය අතට ගත් පසුව ලක් පුරවැසියකුට ඒ මොහොතෙම වුවත් රටින් පිටව යා හැක. ඔවුන්ට ගුවන් තොටුපළෙන් ද "එසැණ ටිකට් පත්" ලබා ගත හැකි එයින් එය ද බාධාවක් නොවෙයි.

"හෙට, මේ වෙලාවට.... ඔව් ....හෙට මේ වෙද්දි මම ඇමෙරිකාවේ"

ලලනාගේ දෑස් විශාල විය. කට ලොකු විය, නළල පලල් විය, සතුට වැඩිකමට ඇය කෑ ගැසුවා ය.

"තාත්තියෝ"

"අම්මියෝ" මම ද කෑ ගැසුවෙමි.

එහෙත් සමඟ ම පඩි පෙළ දිගේ වේගයෙන් කාමරය දෙසට ඇවිද එන රොබට්ටිගේ යකඩ කකුල්වල හඬ මට ඇසුණෙන් මම දොර දෙසට හැරුණෙමි. රොබට්ටී කඩාගෙන බිඳගෙන කාමරයට දුව ආවා ය.

"මොකද උඹට වෙලා තියෙන්නේ?"

"පැක් පැක් පැක් මහත්තයා ඔබ හොඳින් ද..කියන්න ඔබ හොඳින් ද පැක් පැක් පැක්?"

"ඔව් ඔව් බන්... ඇයි මේ පිස්සුවෙන් වගේ?"

රොබට්ටී ඇයගේ යකඩ ඇස් කාමරය හැම පැත්තකට ම හරවා බැලුවා ය.

"පැක් පැක් පැක්, මහත්මයා අම්මියෝ කියලා කෑ ගහපු නිසා, මගේ සිස්ටම් එකට මහත්මයාට අනතුරක් කියන සංඥාව ආවා, පැක් පැක් පැක්"

"මොකක්?" මම දුරකතනය දිහා බැලුවෙමි.

ලලනා තවමත් එහි ඇත. ඇයට පෙනෙන්නට මම දුරකතනය රොබට්ටී දෙසට හැරවූවෙමි. ලක් තාක්ෂණයේ අපූරුව ගැන ඇයත් දැක ගත යුතු ය.

"ලලනා මේ ඉන්නේ අපේ රොබට්ටී, කුසුමා ප්‍රෝ 117"

"හෙලෝ කුසුමා" ලලනා ඇයට ආමන්ත්‍රණය කළා ය.

"හෙලෝ හෙලෝ" රොබට්ටී ඇයගේ සිස්ටම් එකෙන් ලලනාගේ රූපය විමර්ශනය කරමින් ඇත.

"සාරා ලුවී බාචර්, ඇමෙරිකානු පුරවැසියක්, වයස අවුරුදු විසි පහයි, පැක් පැක් පැක්, හෙලෝ සාරා, මම කුසුමා ප්‍රෝ වන්"

රොබට්ටී රොබෝ කට සොලවමින් පවසද්දි ලලනා සිනහාවෙන්නට පටන් ගත්තා ය.

"මම ලකට ආවට පස්සේ අපිත් රොබට්ටියක් ගමු"

"ඔව්... දැන් අලුත් වර්ෂන් එක තියෙනවා, මීට වඩා සෙක්සි ඒවා"

"සෙක්සි ඒවා ඕන්නෑ" ලලනාගේ මුහුණ අඳුරු විය.

"ඇයි?"

"නැහැ එහෙම ඕන්නෑ, ඔය වගේ එකක් හොඳයි"

"ආ එහෙනම්"

මම යළිත් රොබට්ටි දිහා බැලුවෙමි.

"උඹ මොකද තවම ඉන්නේ දැන් පලයන් අම්මා ළඟට, ගිහින් වැඩක් කරලා දියන්"

"පැක් පැක් පැක්, මම සිස්ටම් එක අප්ඩේට් කරනවා. 'අම්මියෝ කියලා' කෑ ගහන්නේ අනතුරකට නෙමෙයි" රොබට්ටි යන්නට හැරුණා ය.

"ඔව් අනතුරකට නෙමෙයි සතුට වැඩිකමට" මම ලලනා දෙස බලා සිනහසුණෙමි. රොබට්ටි යළිත් මගේ දෙසට හැරුණා ය.

"පැක් පැක් පැක්, සතුට වැඩිකමට? එය නිවැරදි ද මහත්මයා"

"ඔව් ඔව් බන් නිවැරදියි, උඹ ඒ විදියට ඕක අප්ඩේට් කරගනින්"

"පැක් පැක් පැක්, මහත්මයා එය යළිත් සනාථ කරන්න"

රොබට්ටි නිසා මා එතෙක් සිටි සතුට කෝපයකට හැරී එන්නට විය. මම ඇයව කාමරයෙන් එළවා දොර වසා දැමීමට ඇඳෙන් බැස්සෙමි.

"පලයන්, මට නිදහසේ ඉන්න ඕන"

"පැක් පැක් පැක්... සතුට වැඩිකමට කරන්නේ මගේ චිත්තය ඇතුළට අත දාන එක නෙමේ ද මහත්මයා?"

"මොකක්?" මාව තෘෂ්නිම්භූත වී ගියේ ය.

"පැක් පැක් පැක්... මහත්මයගේ තාත්තා මගේ සිස්ටම් එක අප්ඩේට් කරලා තියෙන්නේ ඒ විදියට, පැක් පැක් පැක් එය මා යළිත් නිවැරදි කළ යුතු ද මහත්තයා"

රොබට්ටි පැවසුවෙන් මාව ඇඳේ ම යළිත් ඉන්දවිය.

සුද්දි

මම හෙට ඇමෙරිකාව බලා පිටත් වන බැව් අම්මාට කීවෙමි. ඇයත්, තාත්තා මෙන් ම මට බැන වැදුණා ය.

"උඹටත් එහෙනම් වදාපු අම්මට වඩා සුද්දියෙක් ලොකු වුණා"

"අම්මට වඩා මොන ලොකුවක් ද, එයත් අම්මගේ ගානට තමයි ඉන්නේ" ඇයගේ කෝපය ඉදිරියේ මම සිනහසුණෙමි.

"උඹට හැමදේම විහිළු, එහෙත් කසාදයක් කියන්නේ විහිළුවක් නෙමේ ඒක මතක තියාගනින්. මේ පින්බිමේ සක්විති රජවරු ඉපදුණාට ඔය "කාවේ" ඉපදෙන්නේ නිකම්මූ, බලහන් මේ කළු කෙල්ලෝ; උන් කන්‍යාවියෝ. ඕන තැනක බයක් සැකක් නැති ව තියලා යන්න පුළුවන්. පති භක්තිය ජීවිත කාලය ම වුණත් රැකගෙන හිඳියි. කාට මොන දේ අල්ලන්න දුන්නත් පුන්ඩුච්චියට අතක්වත් තියන්න දෙන්නෑ තමන්ගෙ ම මිනිහට හැරෙන්න. ඔය සුද්දියෝ එහෙමද? සකල සර්වාංගය ම එළියේ, ඕන එකෙක්ට ඇවිත් ඕන තැනකට ඇඟිල්ල ගහලා යන්න පුළුවන්... අනේ

මන්දා උඹත් කරගන්න යන දේවල්" අම්මා කම්මුලට අතකුත් තබාගෙන හීල්ලුවා ය. "උඹට තවමත් කල් තියෙනවා මයේ පුතේ ඔය මනස්ගාත අතෑරලා ලකේ කෙල්ලෙක් එක්ක පෙළවහක් කරගන්න... ඔන්න ඕක අතෑරලා දාපන්" ඇය මගේ හිස පිරිමදින්නට සැරසුණා ය. මම ඇයගේ අත ගසා දැම්මෙමි.

"මම තීරණය අරගෙන ඉවරයි. හෙට මම යනවා එච්චරයි" මම කීවෙමි.

"එහෙනම් ඉතින් කරගනින්කෝ, හැබැයි තෝ "කාවට" ගිහින් මේ පැත්ත පළාතක එන්න නෙමෙයි ඔය සක්කරවට්ටමත් එක්කගෙන. උඹට ආයේ මේ ගෙදර දොර වැහිලා"

"කමක් නැහැ... අම්මලට ලලනව පිළිගන්න බැරි නම් මටත් අම්මලගේ කිසිදෙයක් ඕන නැහැ."

"අපෙන් දෙයක් නෙමෙයි ගොනෝ, ලක් රජයෙන් ලැබෙන දේවල් ගැනත් හිතපන්" අම්මා යළිත් හීල්ලුවා ය. "අනේ දෙවියනේ මූට මේ ලකේ අගයක් නොතේරෙන හැටි. ගොනෝ උඹ ලකේ කෙල්ලෙක් බැන්ද නම් රජයෙන් උඹට මොනවද නොලැබෙන්නේ. උඹටයි ඒකිටයි ඉන්න ගෙයක් ලැබෙනවා; මාසෙන් මාසෙට ලක්සෙ ගානේ පොතට එනවා; දරුවෙක් ඉපදුනා නම් ඒ දරුවට වෙන ම ලක්සයක් දෙනවා; උඹට කන්න බොන්න නැත්නම් මාසෙන් මාසෙට සමූපෙන් ගෙදරට ඕන කරන බඩුමුට්ටු ටික දොර ළඟට ම එවනවා; ඕන තැනකට යන්න එන්න හුණ්ඩු කාර් තියෙනවා. මෙහේ උඹට මොනවද අඩු කියපන්"

"ලලනව"

"මොකක්?"

"ඔය සේරම තිබ්බත් ලලනා නැත්නම් මට අඩු ලලනව"

"උඹට කියන කට හොඳයි අර රොබට්ටිගේ ඔළුවේ ගහගන්නවා"

"ඉතින් ගහගන්න"

"ඒ කියන්නේ උඹ මේ අම්මා කියන දේ අහන්නේ නැහැ"

"නැහැ, මට ලලනව ඕන"

"හරි එහෙනම් පලකෝ උඹ ගිහිල්ලමයි මට්ටු වෙන්න ඕන.

හැබැයි යන්න කලින් උඹ ජෝති නෝනව හම්බවෙන්න ඕන"

අම්මා ජෝති නෝනා යැයි කීවේ එහා ගෙදර වාසය කරන ජෝතිෂ්‍ය විශාරද නෝනාට ය. අපේ ගෙදර ඕනෑ ම නැකැත් වැඩක් කරන්නේ ජෝති නෝනා බැවින් යහපත් වැඩක් කරන සෑමවිට ම අම්මා ඇයගෙන් උපදෙස් පැතීමට පුරුදු වී සිටියා ය.

"හ්ම්" මම එය පිළිගත්තෙමි. "හැබැයි ඔය කවුරු මොනවා කිව්වත් මම මගේ තීරණය නම් වෙනස් කරන්නෑ"

"උඹ වෙනස් කළත් නොකළත් උඹ ජෝති නෝනව හම්බවෙලාමයි කරන දෙයක් කරගන්න ඕන" අම්මා ද දරදඬු වූයෙන් මම ඇයගේ අදහසට ඉඩදෙන්නට සිතුවෙමි. ජෝති නෝනා කුමක් කිව්වත් කළත් මා ලලනාව අත් නොහරින බැව් නම් මට විශ්වාස ය.

"අපේ ආදරය අවංක නම් මේ ලෝකේ කිසිම දේකට ඒක වෙනස් කරන්න බැහැ ලලනා" මා ඇයට එදා කිවූ සැටියෙන් ම අදත්, හෙටත්, හැමදාටමත් එක් සිත් ව ජීවත් වෙන්නෙමි. එය ස්ථිර ය.

පැක් පැක් පැක්

හවස් යාමය ගෙවී යද්දි එහා ගෙදර ජෝති නෝනා අපේ නිවසට පැමිණියා ය. කොට වෙන්නට කැපූ කොන්ඩයකින් ද, මහත මුහුණකින් ද යුක්ත වූ ඈ තරබාරු කාන්තාවකි. ලක් නීතියට අනුව තරබාරු කාන්තාවන්ට පොදු හුණ්ඩු කාරයේ ආසන දෙකක් ලබා දෙයි. සමූපෙන් මාසකට හාල් මුට්ටයක් වැඩිපුර එවයි. නිවසේ ඇඳ කුඩා නම් වෙන ම ඩබල් එක්ස් ඇඳක් ලබා දෙයි. ඒ සියල්ල වෙනුවෙන් ම තරබාරු කාන්තාවන් කළ යුත්තේ "බර නම් වාසි" ඇප් එකේ රෙජිස්ටාර් වීම පමණි. කාන්තාවන්ට මෙන් ම පිරිමින්ට ද එවන් ඇප් එකක් ඇතත් කුමක් හෝ හේතුවක් නිසාවෙන් ඔය කියන වරප්‍රසාද පිරිමින්ට ලැබෙන්නේ නැත.

ජෝති නෝනා අපේ නිවසට ඇතුළ් වෙද්දී අම්මා දත් තිස් දෙක ම එළියට දමාගෙන ගොස් ඇයව පිළිගත්තා ය.

"එන්න අක්කේ එන්න, මම මේ අක්කට මතක් කරන්න කියලා රොබට්ටිව යවන්න හැදුවා විතරයි"

"මොනවා මතක් කරන්න ද නංගි, ඇයි අපිට දිවැස් නැතුව ද?"

"ආහ්... ඒකනේ" අම්මා නළලට අත තබා ගත්තා ය.

"දිවැස් ඇති අපිට මොන පණිවිඩ ද, ඕං මේ දැන් ලිලීත් මාව මතක් කරනවා" කී ඇය නළලට අල්ල තබාගෙන ටික මොහොතක් නිහඬව සිටියා ය. "ආ ඒකට කාරි නැහැ ඒක වෙන පළ හිලව්වක්, එහෙත් නංගි උදේම කෝල් කළ එක හොඳයි. නැත්නම් අද හවසට වෙනත් වැඩකට යන්න කියලා ලෑස්ති වෙලා උන්නේ" ජෝති කීවෙන් මට "හික්" ගා ගියේ ය. ඇය මා දෙස ඇස් පුංචි කර බැලුවා ය.

"හික් ගාන එවුන්ට හික් ගෑවිලාමයි යන්නේ පුතෝ, ඒ නිසා හික් ගහද්දී පරිස්සමින්," මටත් ගෝරනාඩුවක් දැම්ම ඇය සාලයට අඩිය තැබීමට පෙර උළුවහුවේ දෙකොන පිරික්සුවා ය.

"ඇයි නංගී"

"නැහැ... මම මේ බැලුවේ හූනෙක් එහෙම අහලක ඉන්නව ද කියලා. මේ මොහොතේ තියෙන්නේ අශ්විද නැකැත. හූනෙක් උළුවහුවේ ඉන්න එකත් සුබයි. චුක් චුක් ගැහුවොත් ඊට වඩා සුබයි" ඇය ඇස් කොනකින් ඉඟියකුත් කර අම්මා සමඟ විරිත්තුවා ය. ඇය සාලයට ඇතුළු වූයේ නිවස දෙසත් හොඳින් විපරම් කරන ගමන් ය.

අම්මා ඒ මොහොතෙ ම රොබට්ටී දෙසට හැරුණා ය.

"කුසුමා පලයන් ගිහින් ජෝති නෝනාට තේ එකක් හදාගෙන වරෙන්"

"පෑක් පෑක් පෑක්, ජෝති නෝනා සීනී අඩුවෙන් ද සීනී වැඩියෙන් ද?"

"සීනී එපා, මේ ටිකේ ඩයට් කරනවා කෙට්ටු වෙන්න" ඇය අම්මා දෙස බලා කීවෙන් මට යළිත් "හික්" ගැසීමට ආවෙන් මා ආයාසයකින් එය නවත්වා ගත්තෙමි.

රෝබට්ටී පස්සත් වන වනා "පෑක් පෑක්" ගාමින් කුස්සියට ගියා

ය. අම්මා විත් ජෝති නෝනා අසල ම පුටුවක හිඳගත්තා ය.

"අක්කට කියන්න ඕන නැහැනේ මේ පොල් බූරුවා කරගන්න යන දේ, අක්කට සේරම පේන්න ඇතිනේ"

"ඔව් ඔව් මට මොකද නොපෙනෙන්නේ" කී ඇය නළලට අල්ලත් තබා ඇස් දෙකත් වසාගෙන ටික වෙලාවක් සිටියා ය. මම ඇය දෙස විමසිලිමත් ව බලාගෙන සිටියෙමි. ඇය විටින් විට දෑස් විවර කොට මා දෙස හොරෙන් බලයි.

"හ්ම්... දැන් කවද්ද ඕක වෙන්න යන්නේ"

මම "මොකක් දැයි" ඇසීමට කට විවර කළෙමි. එහෙත් ඊටත් කලින් අම්මාගේ මෝඩකම ඉස්සර විය.

"හෙට කියන්නේ, හෙට මූ "කාවට" යන්නයි ලෑස්තිය"

"හෙට ...හ්ම්... ඒකනේ... අපලයි අපලයි. ලකෙන් පිටත් වෙන්න හෙට අපලයි. අඟහරුවාදා කුජ නැකත, උදේ වරුව ම කොහෙත්ම අපලයි. හවස එකෙන් පස්සෙ නම් සීරුමාරුවක් තියෙනවා, රට ගමනක් නම්" ඇය යළිත් මා දෙස හොරෙන් බැලුවා ය. "රට ගමනක් නම් විභාගයක්.....විභාගයක්"

"විභාගයක් නම් ඒකත් එකක් මූ මේ කාවේ..." අම්මා හඬ මදක් අඩු කොට ජෝති නෝනා දෙසට නැඹුරු වුණා ය.

"කාවේ සුද්දියක්, නව නිංගිරාවක් අපේ පවුලට ම"

"දෙයියනේ" ජෝති නෝනා කම්පනයකකින් මෙන් නැගිට්ටා ය. දොහොත් මුදුන් දී උළුවස්සේ ඇති බුදු පහන අසලට ගොස් ආවේශයෙන් මෙන් වෙවුලන්නට පටන් ගත්තා ය.

"පවුලට විතරක් ද, පවුලට විතරක් ද මුළු ලකට ම නව නිංගිරාවක් මුළු ලකට ම නිංගිරාවක්... කාවේ එවුන් මොක්කුද නංගියේ, දියුණු එවුන් ද? විළි ලැජ්ජාවක් තියෙන එවුන් ද? අනාගතයක් තියෙන එවුන් ද? හිඟන්නෝ පිනට කන එවුන්... ලක් ආණ්ඩුවෙන් ම බිලියන කීයක් පිනට දෙනව ද ඕකුන්ට"

ජෝති නෝනාගේ දේශනාව ඉදිරියේ අම්මා තවත් හීල්ලුවා ය. කම්මුලට අත තබාගෙන මා දෙසට හැරී සුපුරුදු ලෙස ම බැන වැදුණා ය.

"දැක්කනේ ජෝති ඇන්ටිත් කියනවා, උඹ නම් එහෙන් පිටින් ම ගොනෙක්, කිව්ව ම අහලා ඕක නවත්තලා දාපන්"

"බැහැ බැහැ බැහැ බැහැ, මම හෙට යනවා යනවමයි, ඒක වෙනස් කරන්න කාටවත් බැහැ" මම මුරණ්ඩු වූවෙමි.

"ඔය කතා කරන්නේ කොළුවා නෙමෙයි නංගියේ, ඒරාෂ්ටකේ, සෙනසුරාගේ මල්ලී හෙණවුරා. උෆට යමක් ඕනෙ නම් උෆ හිතට කොටනවා මෝල් ගහෙන් වංගෙඩියට කොටනවා වගේ ඩාං ඩාං ගහලා. හිත කුඩු කරලා, ගල් කරලා දානවා. ආයේ වෙන කිසිම දේකට ඇහුම් කන් දෙන්න හිතෙන්නෑ. දැන් ඉතින් ඔය ඒරාෂ්ටකේ ගෙවෙනකන් ම කොල්ලා ඔහොම තමයි. ඕක ගෙවුණ ම තමයි මේකා පියවි සිහියට එන්නේ. ඇත්ත නැත්ත තේරෙන්න පටන් ගන්නේ. මේ වෙලාවට කොච්චර ඕවා ගැන තේරුම් කරලා දුන්නත් වැඩක් නැහැ."

ජෝති නෝනා තවත් කිහිප වතාවක් ම බුදු පහන ඉදිරියේ ඔළුව පද්දමින් මොනවදෝ දෙඩෙව්වා ය. ඉන්පසුව එක්වර ම ශාන්තිමත් වී සෝපාවට ම විත් හිඳගත්තා ය.

"මට මේකට කොරන්න දෙයක් නැහැ නංගී. කියන දේ නහන එකා උඩින් ගියත් එකයි බිමින් ගියත් එකයි කියනවනේ ඕන් ඔහේ යන්න දෙන්න. ගිහින් මට්ටු වෙලා එන්නැතැ. හැබැයි කොලුවෝ අපේ දර්ශනේ අනුව වැඩ කරපන්. හැමදේම දිහා සතියෙන් බලපන්. සතිය කිව්වේ සිහිය, නිකන් නෙමෙයි යහපත් සිහියෙන් බලපන්. එතකොට ඔය වෙන්න තියෙන අපල උපද්‍රවයක් වුණත් එහෙට මෙහෙට මාරු කරලා දාන්න පුළුවන් ලොකු විප්පත්තියක් නොවෙන විදියට. නිවැරදි ව පිළිපැද්දොත් අපේ බුදු දහමෙ ම ඔය හැමදේට ම විසඳුම් තියෙනවා නොවැ." ඇය ඒ කියූ දේ නම් සත්‍යක් යැයි මටත් සිතුණේ ය. ලකේ වැසියෝ නිවැරදි බුදු දහම අනුගමනය කරන්නෝ වෙති. ලකට ආසන්නයෙන් ම ඇති බමුණු රටේ කුල සිරිත් සහ ජෛන ආගම් ද කුඩා කොටස් වශයෙන් ලකට ආගමනය වී තිබුණ මුත් ඔවුහු තවමත් පිරිසිදු බුද්ධ දර්ශනය අනුගමනය කරන්නෝ ය. නිරන්තරයෙන් ම සම්මා සතිය, සම්මා සමාධිය ආදී යහපත් සිතුවිලි ගැන ම කතා කරන්නෝ වෙති. අනුන්ට ඒ මාර්ගයේ ගමන් කරන්නට උපදෙස් දෙන අතර ම

තමන් ද ඒ මාර්ගයේ ම ගමන් කරන්නෝ ද වෙති.

"ඔය පුත්‍රයා වැටිලා ඉන්නේ රතියකට, තවම පොඩි එකා නිසා මේකා ඒකට අහුවෙලා. ඔය සුද්දිගේ උණ්ඩුච්චිය දකිනකන් මේකට ඉවසිල්ලක් නැතිව ඇති. ඒවා එහෙම තමයි... ඔය පාඩම් ඉගෙන ගන්න වයස. ඒ නිසා නංගී මේකාට ඕක කරගන්න දීලා පැත්තකට වෙන්න. ඔයා දැන් හඬල වැලපිලා, ගහලා බැනලා මොනවා කිව්වත් මේකගේ ඔළුවට ඕවා යන්නෑ. තමන් ම ඉගෙන ගත්තොත් මිසක් වෙන කෙනෙක්ට තේරුම් කරලා දෙන්න පුළුවන් ගැටයක් නෙමෙයි ඔය"

ජෝති නෝනාගේ ඒ කතාවෙන් අම්මාගේ හිත මඳක් සැහැල්ලු වෙන බව පෙනුණා ය. අම්මා ලොකු හුස්මක් උඩට ගෙන එය පිට කළා ය.

"එහෙනම් ඉතින් හිත හදාගන්න එක හැරෙන්න වෙන දෙයක් කරන්න නැහැ" ඇය කීවා ය.

"වෙන මොනවා කරන්න ද? පුතාට කාවේ එකියක් ම ඕනෙ නම් කරගන්න කියන්න. හැබැයි පුතෝ මේ ජෝති ඇන්ටී අද කිව්වා කියලා මතක තියා ගනින්, මේ ධර්මද්වීපයේ මිනිස්සු වගේ නෙමෙයි ඕකුන්, උන් මිථ්‍යාව පස්සේ යන එවුන්, ලකේ මිනිස්සු කවදාවත් මිථ්‍යාව පස්සේ යන අය නෙමෙයි. අපි පිළිපදින්නේ දර්ශනයක්, අපි උන් වගේ දෙවියෝ අදහන්නේ නැහැ, විශ්වාස පස්සේ දුවන්නේ නැහැ, අපි මුල් තැන දීලා තියෙන්නේ මෙන්න මේකට" කී ඇය ඇඟිල්ලෙන් ඔළුවට තට්ටුවක් දැමුවා ය.

"මනස, මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා - මනසා චේ පදුට්ඨේන - භාසතීවා කරෝතිවා. මනසෙන්මයි හැමදේම ඇති වෙන්නේ, ඒ නිසා මනසමයි සංවර කරගන්න ඕන. මම ඒකයි ඔයාට කලිනුත් කිව්වේ හැමදේම නිවැරදි සිහියෙන් දකින්න කියලා... හ්ම් හ්ම් ඒවා ඔයා හිමිහිට තේරුම් ගනියි. අපි නම් ඔය වයස පහුකරලා ඇවිත් නිසා ඕවා සේරම හොඳට වටහාගෙන ඉන්නේ"

"ඉතින් ඒකමනේ අපි මුන්ට තේරුම් කරලා දෙන්න හදන්නේ නේද?"

"ඔව්... එහෙත් වැඩක් නැහැ නගා, ඔය රතිය, ඒකට අහු වුණොත් ආයේ ගොඩගන්න ලේසි නැහැ"

"හ්ම්..." අම්මා යළිත් හිල්ලුවා ය. "ඕකුන් කන්‍යාවියොත් නෙමෙනේ අක්කේ, ඕකුන්ගේ උණ්ඩුච්චියට හැම එකා ම ඇඟිල්ල ගගා යනවා. අනික විළි ලැජ්ජාවක් කියලා දෙයක් තියෙනව ද? ලකේ කෙල්ලෝ වගේ හික්මීමක් තියේ ද? මට ඒකමයි වේදනාව"

"හරි හරි...දැන් ඉතින් ඕවා කතා කරලා වැඩක් නැහැ. යන එකාට යන්න දෙමු. ඔක්කෝම එවුන් ඇඟිල්ල ගහපු එකට මේකත් ඇඟිල්ල ගැහුව ම ලකේ කෙල්ලන්ගේ අගේ මූටත් තේරෙයිනේ. අන්න එදාට අක්කා පුතාට මෙහෙන් හොඳ විවහයක් කරලා දෙන්න. ලකේ විස්ව විද්‍යාලේ යන කෙලියෝ කොහොමත් විවහා වෙන්නේ තිහ පහුවෙලා. හැබැයි ඉතින්" ජෝති නෝනා අම්මා ළඟට කට ළං කළා ය... "හැබැයි කන්‍යාවියෝ... තිහ පහු කළා, ලොකුවට ඉගෙන ගත්තා කියලා නැහැ, ඒක නම් හොඳටෝම රකිනවා"

ඒ වචනෙට අම්මාගේ ඇස් උඩ ගියා ය.

"පති වෘත්තෙනේ අක්කේ... ලකේ කෙලියෝ ඒකට නම් දිව්‍ය ලෝකෙටත් එහා"

"නැතුව නැතුව... ගිය සතියේ අර ජවුසා කෙලීත් කසාද බැන්දනේ, ඒකී බදිද්දී වයස කීයද දන්නව ද?"

"කීයද?"

"හතළිස් පහක්"

"එච්චර" අම්මා කම්මුලට අත තබා ගත්තා ය.

"ඔව්.. හැබැයි ඉතින් වයසට ගිහින් තියෙන්නේ නිකන් හිඳලා නෙමෙයි. උපාධි තුනක් අරගෙන, මහාචාර්ය උපාධියත් පාස් කරලා..."

"නැහැ"

"නැහැ නෙමේ ඔව්, හැබැයි හොඳම එක ඒක නෙමෙයි"

ජෝති නෝනා තවත් කට අම්මා දෙසට ළං කළෙන් මමත් කන ඒ පැත්තට හැරවූවෙමි.

"හතළිස් පහක් වුණත් කෙල්ල කන්‍යාවියක්... ඔව්... පහුවෙනිදා රතු ඇපල බලන්න මමත් ගියානේ, බෙඩ් ෂීට් එක බලලමයි මම මඟුලට නැකත තීන්දු කළේ"

ඇය කී දෙයින් මම ද පුදුමයට පත් වූයෙමි. එහෙත් ලක් නීතිය අනුව විවහා වීමට පෙර "රතු ඇපලය" බලා, බෙඩ් ෂීට් දත්ත මත මනමාලයාගේ මවට පුතාගේ මඟුල තීන්දු කළ හැකි ය. එයින් ඈ කියූ දේ ඇත්තක් විය යුතු ය.

ජෝති නෝනාගේ අස්වැසිල්ලට වඩා ඇයගේ රතු ඇපලයේ කතාව අම්මාට ලොකු ජයග්‍රහණයක් වෙන්නට ඇත. ඇය ඇඟිලි නවමින් යමක් ගණනය කොට මා දෙසට හැරුණා ය.

"හරි මම තීන්දුවක් ගත්තා" ඇය එක්වර ම කීවෙන් මම ඇය දෙසට හැරුණෙමි.

"මොකක්ද?"

"උඹ පලයන්"

"යනවා තමයි... අම්මා එපා කිව්වත් මම යනවා"

"ඉඳපන් කියනකන් ගොං බූරුවා"

"ඉතින් කියන්න"

"උඹට දැන් විසි පහයිනේ, උඹ පල, කොහොමත් ඔය කාවේ එවුන් එක්ක කරගන්න කසාදයක් අවුරුදු දෙක, තුනකට එහා තියෙන්නේ නැහැ. උඹ නික්කාවට ම අවුරුදු තිහකටත් කලින්ම ඕකිගෙන් වෙන් වෙනවා"

"තිහ නෙමෙයි" ඒ මොහොතෙම නළලට අත තබාගත් ජෝති නෝනා බාධා කළා ය.

"අක්කට පේනව ද?"

"නැතුව නැතුව... විසිදෙක... තව අවුරුදු දෙකකින් ඕක කම්බස්"

අම්මගේ මුහුණ එක්වර ම ආලෝකමත් වී ගියා ය.

"අනේ වාසනාවන්..." ඈ මිමුනුවා ය. "අන්න එතකොට උඹ මේ අම්මා කියන විදියට වැඩ කරන්න ඕන... උඹ මට ඒක පොරොන්දු වෙනව ද?"

මම කල්පනා කළෙමී. අවුරුදු දෙකකින්? මගේ මුහුණෙන් සිනහවක් පිට විය. ලලනා මාවවත්, මම ඇයවවත් අවුරුදු දෙකකින් කොහෙත් ම අතාරින්නේ නැත. අපේ පාරිශුද්ධ ආදරයේ නාමයෙන් ජීවිත කාලයේ ම එක්ව සිටින්නට අපි දිවුරුම් දී ඇත්තෙමු. එවන් ආදරයක් අවුරුදු දෙකකින් කෙසේ අවසන් වන්න ද?.

"හරි එහෙම වුණොත් මම අම්මා කියන විදියට කරනවා"

"හරි එහෙනම් උඹ මට පොරොන්දු වුණා පුතෝ මේ ජෝති අක්කා ඉස්සරහම"

"ඔව්..පොරොන්දු වෙනවා" මම යළිත් කීවෙමි.

"එහෙනම් එච්චරයිනේ" ජෝති නෝනාගේ මුහුණෙන් සිනහවක් පිට විය.

"මූ ඒ කාවේ එකියගෙන් මිදුණ දවසට මම මෙයාට හොඳ කන්‍යාවියක් හොයලා දෙන්නම්. මටත් ඒක නම් නංගිට පොරොන්දු වෙන්න පුළුවන්"

එය එතැනින් අවසන් විය. අම්මාත්, මාත් අතර ඇති වුණු සම්මුතිය අනුව මම ලලනාව අත හැරි දවසට ලකේ කන්‍යාවියක් ව විවාහ කර දීමේ අටියෙන් අම්මා ද මා සමඟ වූ විරසකය අවසන් කර දැම්මා ය.

"එහෙනම් මම යනවා" ජෝති නෝනා යාමට නැගිට්ටා ය.

"එහෙත් සමඟ ම තේ බංදේසියත් සමඟ සාලයට දිව ආ රොබට්ටී ඇයගේ මයික් කටින් කෑ ගසන්නට විය.

"පෑක් පෑක් පෑක්, ජෝති නෝනා තේ එකත් බීල ම යන්න"

"දැන් බැහැ කුසුමා දැන් මම ගෙදර යන්න ඕන මහත්තයා එන වෙලාවනේ"

එවිට, කුසුමා බන්දේසියත් අතේ තබාගෙන ම "පෑක් පෑක් පෑක්" ගසමින් කුමක් හෝ පරීක්ෂා කරන බව පෙනිණ.

"දැන් මහත්තයා එන්නෑ නෝනා, නෝනගේ මහත්තයා ඒ කියන්නේ "තිස්ස පුත්තැන්නේ" මේ වෙලාවේ නොම්මර හතළිස්පහ මෝදර කියන ලිපිනයේ පදිංචී "රේඛා ඉන්දුමදී"ගේ කට සූප්පු කරනවා. පෑක් පෑක් පෑක්" රොබට්ටී කීවෙන් ජෝති

නෝනාගේ ඇස් උඩ ගියා ය. ඇයගේ තරබාරු මුහුණ රතු වී තොල් කට පූට්ටු විය.

"මම යන්නම්" බොහෝම සාමකාමී ව කී ඇය, ඊළඟ නිමේෂයේ ම ඇතින්නියක් කුලප්පු වුණු ගානට නිවසින් එලියට දිව්වා ය.

ඇය දුව යන ආකාරය අනුව මට "හික්" ගා ගියෙන් අම්මා මා දෙස රවා බැලුවා ය.

"පවුලක් වෙනවා කියන්නේ ඕකට තමයි, පොඩි පොඩි අඩුපාඩු වෙනවා" ඇය කීවා ය. "ජෝතිගේ මිනිහා නිදාගන්න ඇත්තේ එක ගැනියෙක් එක්කනේ, බලපන්කෝ උඹේ ඔය ලලනාවිය, ඕකී එක එකා එක්ක නිදාගන්න විදියට උඹේ ඔය හික්කාවට ඉස්පෝල්ලේ ගිහින් නවතින්නේ" අම්මා එසේ පවසමින් යළි කුස්සියට යෑමට හැරුණා ය. තවමත් රොබට්ටී සාලයේ ය. යමින් ගමන් රොබට්ටි දෙසට හැරී කුතුහලයෙන් බැලූ අම්මා ඇයට මෙසේ කීවා ය.

"මෙහේ වරෙන් මට උඹෙන් කාරණයක් දැන ගන්න තියෙනවා"

මම ඒ මොහොතෙම ගෙදර ඔරලෝසුවේ වෙලාව බැලුවෙමි. වෙලාව සවස 6ට ආසන්නව ඇත. තාත්තාගේ ඔෆීසිය සවස පහට අවසන් වන මුත් ඔහු ද ගේ මායිමක නැත.

මල්වත්තනම් ටැටූස්

මම කාමරයට විත් ලලනා සමඟ පෙම් කෙළින්නට වීමි. පැය දෙක තුනක් එක දිගට ඈ සමඟ පෙම් කළ මම ඇඳෙහි වැතිර ම දෑස් වසා ගත්තෙමි. ලලනාගේ ආදරය මගේ හදවත සුමට කර ඇත. එහෙත් ඒ සුමට බව ඇතුළෙන් එක් ස්නායුවක සිහින් රිදුමක් එයි. මම කල්පනා කළෙමි.

"ජෝතී ආන්ටීට දිවැස් ඇත. ඇය අපේ ආදරයට අවුරුදු දෙකක් ගැරන්ටි දුන්නේ ඇයට සැබැවින්ම එය පෙනුණ නිසා ද?"

"නැහැ එහෙම වෙන්න බැහැ. දිවැස් තියෙනවයි කියලා ගොඩක් සාස්තරකාරයෝ කරන්නේ රඟපෑම. එහෙනම් ජෝති ආන්ටිට බැරි වුණා ද තමන්ගෙ ම මිනිහා වෙන ගැනියෙක්ගේ

කට සූප්පනවා දකින්න".

"නැහැ කොහෙත්ම වෙන්න බැහැ" මම සිතුවෙමි.

මම එම අදහස මනසින් මකා දමන්නට වෑයම් කළෙමි. එහෙත් ඒ සෑමවිට ම එය සිහින් ස්නායුව දිගේ දිව විත් මගේ පපුවට තදින් දැනෙන්නට පටන් ගත්තේ ය.

"නිකමට හරි එහෙම එකක් වුණොත්, අවුරුදු දෙකකින් මගේ ලලනා මාව දාලා ගියොත්?"

මගේ ඇස් දෙකෙන් කඳුළු මතුවිය. බඩ බොක්ක බුරුල් වී ගියේ ය. මයිල් තුනී වෙන්නට පටන් ගත්තේ ය.

"නැහැ එහෙම වෙන්න දෙන්න බැහැ." මගේ ආදරය පාරිශුද්ධ යි. ඒ පාරිශුද්ධ ආදරයේ නාමයෙන් එය නිතරම මතක් වෙන්න මම මොකක් ම හරි කරන්න ඕන.

"රොබට්ටි, රොබට්ටී" මම කෑ ගැසුවෙමි.

ඩාං ඩාං ඩාං හඬත් සමඟ යකඩ කකුල්වලින් පඩි පෙළ දිගේ දුවමින් රොබට්ටී එසැණින් ම කාමරයට දිව ආවා ය.

"පැක් පැක් පැක් මහත්තයා මට කතා කළා ද?"

"ඔව්... ඔව්... ඔය දොර වහපන්"

රොබට්ටි දොර වැසුවා ය. එහෙත් සමඟ ම අනිත් පස හැරුණු ඇයගේ යකඩ අතින් චිත්තය ගලවන්නට විය.

"උඹ ඔය මොකක්ද කරන්නේ?"

"පැක් පැක් පැක්.... මහත්තයා දොර වහන්න කිව්වේ?"

"ඉතින් උඹ ඔය රෙද්ද ගලවන්නේ"

"පැක් පැක් පැක්, ඇයි ඊට පස්සේ වෙන්නේ මේක නෙමේ ද මහත්තයා?"

මම ඔළුවට අත තබා ගත්තෙමි. අම්මත්, ජෝති ආන්ටීත් මදිවට මේකිත් මගේ ඔළුව අවුල් කොට ඇත.

"පැක් පැක් පැක්... සමාවෙන්න මහත්තයා, ලොකු මහත්තයගෙ යි ඔබෙයි විධාන මම වෙන වෙන ම සටහන් කර ගත යුතු යි."

"ඔව් ඔව් එහෙම කරගනින්" මම ඔළුවත් අල්ලාගෙන කීවෙමි. "තත්තා උඹට කියන ඒවා වෙනම තියාගනින්, මට ඒවා ඕන නැහැ මට ලලනා ඉන්නවා" මගේ මුහුණෙන් යාන්තම් වූ සිනහවක් මතු වී අවේ ය. රොබට්ටි එහි අර්ථය වටහා ගන්නට ඇත. චීත්තය යළිත් ඇඳ ගත් ඈ සීරුවෙන් හිටගත්තා ය.

"උඹත් මගේ ඔළුව අවුල් කරනවා. මම උඹට එන්න කිව්වේ වැදගත් කාරණාවකට"

"පැක් පැක් පැක් කියන්න මහත්තයා කුසුමා ප්‍රෝ වන් ඔබේ සේවයට වාර්තා කර සිටිනවා"

"හ්ම්" මම රොබට්ටි අසලට ළං වුණෙමි.

"උඹ මට කාරණයක් කියන්න ඕන"

"පැක් පැක් පැක්"

"අවංකව ආදරය කරන කෙනෙක්ට ඒ ආදරය හැමවෙලේ ම මතක් වෙන්න මොකක්ද කරන්න ඕන"

රොබට්ටි යළිත් "පැක් පැක් පැක්" ගැසුවා ය. ඉන්පසුව ඇයගේ නිල් යකඩ ඇස් දෙක මා දෙසට යොමු කළා ය. මගේ ඇස් පරීක්ෂා කරන්නට මෙන් ඒවා එහාට මෙහාට ටික මොහොතක් සෙලවුණේ ය. ඉන්පසුව යළිත් වරක් "පැක් පැක් පැක්" ගැසූ ඇය මෙසේ කීවා ය.

"මහත්තයා ආදරය කරනවා"

මම ලැජ්ජාවෙන් ඇඹරුණෙමි.

"ඔව් බං ඔව්"

"මහත්තයට ඕනේ එයාව නිතරම මතක් කරන්න"

"හ්ම්, ඒක තමයි ඉතින් මම උඹෙන් ඇහුවේ, මොකක්ද කරන්නේ කියලා"

"පැක් පැක් පැක්... " ටික මොහොතක් ඇයගේ දත්ත ගබඩාව පරීක්ෂා කළ ඈ, එක්වර ම සුදු බිත්තිය දෙසට හැරුණා ය. එයත් සමඟ ම ඇයගේ රොබෝ ඇසින් ආ කිරණක් චිත්‍රපටයක් මෙන් බිත්තියේ දර්ශන මැවුවේ ය.

එහි වූයේ වෙළඳ දැන්වීමකි.

"ලක් වැසියනි, ඔබ ආදරයෙන් මුසපත් වෙලා ද? සත්‍ය ප්‍රේම බුංග රාජයාගේ මල්සර පහසට ඔබත් නතු වෙලා ද? අමතක කරන්න ම බැරි ද? කොතරම් උත්සහා කළත් ආදරය බඩ බොක්ක රත් කරනව ද? හදවත සැරෙන් සැරේ ඩග් ඩග් ගානව ද? නින්ද යන්නේ නැති ද? ඔහුව හෝ ඇයව පපුව උඩ ම තියා ගන්න හිතෙනව ද?

මෙන්න ඒකට හොඳම ක්‍රමය ----

ටැටූ නම් මල්වත්ත

මල්වත්ත නම් ටැටූස්

අංක 6, මල්වත්ත පාරේ "ආදර ටැටූස්" වෙත දැන් ම පිය නගන්න.

ආදරය සදාතනික මතකයක් ලෙස පපුවෙ ම කොටාගන්න"

දැන්වීම අවසන් විය. රොබට්ටිගේ ඇසින් නිකුත් වූ ආලෝක කදම්බය නිමී යත් ම ඇය හිස මා දෙසට හැරෙවූවා ය.

"ආදර ටැටූස්" ඇයත් එම වෙළඳ දැන්වීමේ හඬින් ම ලාලිත්‍ය ව පැවසුවා ය.

මම ප්‍රීතියෙන් මුසපත් වී ගියෙමි.

"නියමයි රොබට්ටී, නියමයි..." හදවතට ආ සතුටට එක්වර ම ඇය අසලට පැන්න මා ඇයව තරයේ වැලඳ ගත්තෙමි.

ඇයගේ යකඩ පියයුරු කෙළින් වන්නට විය. ඒ යටින් ඇති මැෂින් පපුවේ ගැස්සිල්ල මට දැනෙන්නට පටන් ගත්තේ ය. ඇයගේ චීත්තයත්, හැට්ටයත් නිසා ඈ රොබට්ටියක් නොව සැබෑ ම කාන්තාවක් යැයි ඒ නිමේෂයේ ම මට හැඟුණෙන් මගේ සංවර සිත එහාට මෙහාට චංචල වූවේ ය.

එහෙත් එක්වර ම ඒ අසංවර සිතුවිලි මැද මට ලලනාව මතක් වූවෙන් මම ඇයගෙන් ඈත් වූවෙමි.

ටික මොහොතකට කාමරය පුරා ගැඹුරු නිහඬතාවයක් ඇදී ගියේ ය. රොබට්ටි ද මා දෙස බලා සිටියා මිසක කිසිවක් කීවේ නැත.

"මට දැන් තේරෙනවා ඇයි තාත්තා උඹට කැමති කියලා"

"පෑක් පෑක් පෑක්, පිරිමි හෝමෝන ක්‍රියාකාරිත්වය අනුව කන්තාවකගේ ස්පර්ශයෙන් නියුට්‍රික් අම්ල සියයට 25ක් නිපදවනවා. ඒ අම්ලය දහනය ..... "

"ඇති ඇති ඕක නවත්තපන්, දැන් පලයන් මමත් ලෑස්ති වෙලා ටැටූ පාලර් එකට යන්න ඕන"

"පෑක් පෑක් පෑක්" රොබට්ටි අත් දෙකත් සොලවමින් දොර දෙසට හැරුණා ය. මම ඇඳ අසල වූ දර්පනය ඉදිරියේ හිටගත්තෙමි. ඇඳ සිටි කමිසයේ බොත්තම් බුරුල් කොට මගේ පපුව දෙස බැලුවෙමි.

"ලලනා, මම මෙතැන මගේ ලලනගේ නම කොටා ගන්නවා. මගේ හදවත ළඟ ම, මෙන්න මෙතැන" මම පපුවේ වම් පසට ඇඟිල්ල තැබුවෙමි. "ආදරය නිතරම දකිද්දි ඒ ආදරය අමරණීය වෙනවා, සදහටම"

මම ඒ මොහොතෙම පිටත් වූවෙමි. නොම්මර 06, මල්වත්ත පාරේ ඇති ටැටූ පාලර් එකට ගිය මම "ලලනා" යි ටැටූවක් මගේ හදවතට යාබද ව ගැසූයෙමි.

"තව මොනවා හරි ගහන්න ඕනෙ ද මල්ලී" ටැටූ පාලර් එකේ අයියා මගෙන් ඇසුවේ ය.

"ඔව් අයියා, ඕක යටින් ගහන්න 'සත්‍ය ප්‍රේම බුංග රාජයා' කියලා" මම ඔහුට කීවෙමි.

ලලනා මම එනවා.

ඒ සුබ දින එළැඹියේ ය. උදෑසන ආහාරය ගත් මම හුණ්ඩු ටැක්සිය එන තුරු බලාගෙන සිටියෙමි. මගේ ඇඳුම් බෑග් දෙක

සාලයේ ඇත. ඒ අසල සෝපාවේ හිඳගෙන සිටි අම්මා මිදුල දෙස බලමින් හූල්ලමින් සිටියි.

"ඔබේ රියැදුරා තවත් මිනිත්තුවකින් ඔබේ නිවස ඉදිරියට පැමිණෙනු ඇත"

මගේ මොබයිලයෙන් හඬ ඇසෙත් ම පුටුවෙන් නැගිට ගත් මම අම්මාට දණ ගසා වැන්දෙමි. ලක් වැසියන්ගේ චාරිත්‍ර අනුව නිවසින් පිටත් වීමේ දී දෙමව්පියන්ට වැඳීම හොඳ පුතකුගේ සිරිතක් ම ය.

"හ්ම්" අම්මා නොරිස්සුම් බැල්මකින් අහක බලා ගත්තා ය.

"උඹ පරිස්සමින් පලයන්කෝ, වෙන මොනවා කියන්න ද" කී ඇය ඊළඟ මොහොතේ දී ඇස් දෙකේ කඳුළු පුරවගෙන අඬන්නට වූවා ය.

මම ඇයව වැලඳ ගත්තෙමි.

"මම ගියාට ඉන්නෑනේ, එයාවත් එක්කන් ඉක්මනට එනවා"

ඒ වචන ඇසෙත් ම අම්මා කෝපයට පත් විය.

"හා හා මේ, ඒකිව එක්කන් එන්න වෙන තැනක් හොයා ගනින්, මේ ගේ පැත්ත පළාතේ එනවා නෙමෙයි ඔය අඩු කුලේ එවුන් එක්ක. හොඳ වෙලාවට තාත්තා අද නැත්තේ හිටිය නම් උඹ ඔය ගමන යන්න නෙමෙයි"

තාත්තව මතක් කරද්දි මගේ පපුව සීතල වී ගියෙන් මම ඉක්මන් කළෙමි. තාත්තා ඒමට පෙර ඉක්මනින් ම පලා යා යුතු ය.

"මම යනවා. මම එහෙනම් ලලනත් එක්ක කුලී ගේකටවත් යන්නම්"

"ඔව්.. නැතුව ඕකුන් ව මෙහෙට ගේන්න යෑ" අම්මා නොරොක්කාවෙන් කීවා ය.

"මම යනවා"

සූට්කේස් දෙකත් අතට ගත් මා අම්මාට සමුදී. රොබට්ටී දෙසත් බලා මඳ සිනහවක් පෑවෙමි.

ඇය සුපුරුදු පරිදි ම තුන් වරක් "පෑක් පෑක් පෑක්" ගෑවා ය.

"ලලනා මම එනවා" සූට්කේස් දෙකත් ඇතුළට දමා, හුණ්ඩු ටැක්සියේ හිඳගත් මම ලලනාට ලිව්වෙමි.

ඒ අකුරුත් සමඟ ඇඳ සිටි කමිසයේ බොත්තම් බුරුල් කළ මම මගේ පපුවේ පින්තූරයක් ද එයට ඇමිණුවෙමි.

"ලලනා ඔයා දැන් සදහටම මගේ පපුවේ, මම එනවා කෙල්ලේ, මම එනවා"

එය ලලනාට යැවූ මම හුණ්ඩු ටැක්සියේ රියැදුරා දෙස බැලුවෙමි. ඔහු කෝට් සූටයකින් සහා ටැක්සි සමාගමේ ලාංඡනය සහිත නිල් පැහැ ටයි පටියකින් සැරසී ඇත"

"අපි යමු, ගුවන් තොටුපළට"

ඔහු ටැක්සිය පණ ගැන්වූවේ ය. මම අවසන් වතාවටත් මගේ මව දෙස බැලුවෙමි. ඇය කම්මුලටත් අතක් තබාගෙන මා දෙස බලාගෙන සිටියි.

******

ලක් රටේ ගුවන් තොටුපළවල් පනහක් පමණ ඇත. රට වටේ ම ඇති වරායන්වලට වඩා ගුවන් තොටුපළවල් ප්‍රමාණය වැඩි එහෙයින් ලක නැරඹීමට එන සංචාරකයින් හිඟ වන්නාවූ ජූනි, ජූලි සහ අගෝස්තු මාසයන් තුනෙහි දී ලක් ගුවන් තොටුපළවල්වල වී ගබඩා කරයි. එසේ ගබඩා කරන වී අගෝස්තු මාසයෙන් පසුව රට පුරා වෙළඳසැල්වලට යවා අතිරික්ත වී තොග ලකට ආසන්න ම රට වන ඉන්දියානු දේශයට සහනාධාර ලෙස ලබා දෙයි.

මම ලලනා සමඟ පෙම් කෙළිද්දී හුණ්ඩු ටැක්සියේ රියැදුරා උඩු දර්පනය හරහා විටින් විට මා දෙස බලනු පෙනුණෙන් මම පෙම් කිරිල්ල මොහොතකට නතර කර දැමුවෙමි.

"මහත්තයා පව්චේ, මරු හා"

"තැන්ක් යූ තැන්ක් යූ" මම සිනහ වුණෙමි. "මේ මගේ